වාර්ෂික කාර්ය සාධන වාර්තාව

வருடாந்த செயலாற்றுகை அறிக்கை

ANNUAL PERFORMANCE REPORT



2024

භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව

திறைசேரி செயற்பாடுகள் திணைக்களம்

Department of Treasury Operations

මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය

நிதி, திட்டமிடல் மற்றும் பொருளாதார அபிவிருத்தி அமைச்சு

Ministry of Finance, Planning and Economic Development



භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව

වාර්ෂික කාර්යසාධන වාර්තාව 2024

වැය ශීර්ෂය : 249

ඒ.එන්. හපුගල
අධ්‍යක්ෂ ජනරාල්
භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව
011-2484729
dgto@tod.treasury.gov.lk

පටුන

පිටුව

පරිච්ඡේදය 01 - ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය

1.1	හැඳින්වීම	01
1.2	ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු	01 - 02
1.3	ප්‍රධාන කාර්යයන්	02
1.4	සංවිධාන සටහන	03
1.5	දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ	04

පරිච්ඡේදය 02 - ප්‍රගතිය හා ඉදිරි දැක්ම 05-07

පරිච්ඡේදය 03 - වසරේ සමස්ත මූල්‍ය කාර්ය සාධනය

3.1	මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය	08
3.2	මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය	09
3.3	මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය	10
3.4	මූල්‍ය ප්‍රකාශ සටහන්	11
3.5	ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය	12-13
3.6	වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගි කර ගැනීමේ කාර්ය සාධනය	13
3.7	මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/දෙපාර්තමේන්තුවල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට / දිස්ත්‍රික් ලේකම් කාර්යාලය / පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන	14
3.8	මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය	14
3.9	විගණකාධිපතිවරයාගේ වාර්තාව	15

පරිච්ඡේදය 04 - කාර්ය සාධන දර්ශක

4.1	ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)	16

පරිච්ඡේදය 05 - තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය

5.1	හඳුනා ගන්නා ලද අදාළ තිරසාර සංවර්ධන අරමුණු	17 - 18
5.2	තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග	18

පරිච්ඡේදය 06 - මානව සම්පත් පැතිකඩ

6.1	සේවක සංඛ්‍යා කළමනාකරණය	19
6.2	ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තය බලපෑම	20
6.3	මානව සම්පත් සංවර්ධනය	21-27

පරිච්ඡේදය 07 - අනුකූලතා වාර්තාව 28 - 33

01. පරිච්ඡේදය- ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය

1.1 හැඳින්වීම

ඒකාබද්ධ අරමුදල් කළමනාකරණයට හා රාජ්‍ය ණය කළමනාකරණයට අදාළ කරුණු සම්පාදනයට කාර්යක්ෂම සංවිධාන ව්‍යුහයක් භාණ්ඩාගාරය තුළ ඇති කිරීම අරමුණු කරගෙන 2004 ජූලි 28 දින භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව ස්ථාපිත කරන ලදී. ඒ අනුව භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව විසින් ජාතික අයවැය තුළ පුරෝකථනය කරන ලද ආදායම් සහ වියදම්, මෙහෙයුම් මුදල් ගලායෑම් හා ගලා ඒම් බවට පරිවර්තනය කිරීමට කටයුතු කරන අතර, වාර්ෂික ණය ගැනීමේ වැඩසටහන මඟින් මූල්‍යනය කළයුතු අයවැය හිඟය හඳුනා ගැනීමටද කටයුතු කරයි. දෙපාර්තමේන්තුවේ රාජ්‍ය ණය කළමනාකරණ කටයුතු තුළ ණය සේවාකරණය හා වාර්තා කිරීමේ කටයුතුද ඇතුළත් වන්නේය.

1.2 ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු

දැක්ම

“ රාජ්‍ය අරමුදල් කළමනාකරණයේ දකුණු ආසියානු කලාපයේ විශිෂ්ටතමයා බවට පත්වීම ”

මෙහෙවර

“අරමුදල් ගිණුම්කරණය හා රාජ්‍ය ණය ගිණුම්කරණය පිළිබඳ භාරකාරත්වය දරමින්, රාජ්‍ය වැය වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා ඒකාබද්ධ අරමුදල හා වෙනත් භාණ්ඩාගාර අරමුදල් කාර්යක්ෂමව හා අරපිරිමැස්මෙන් උපයෝගී කර ගැනීමද, ආදායම් එකතු කිරීම් හා රාජ්‍ය ණය ගැනීම් සම්බන්ධව සම්බන්ධීකාරකයෙකු ලෙස ක්‍රියා කිරීම සඳහා ද කැපවීම.”

අරමුණු

- විධිමත් භාණ්ඩාගාර මුදල් ප්‍රවාහ කළමනාකරණය තුළින් වාර්ෂිකව ජාතික අයවැය ක්‍රියාත්මක කිරීම සඳහා රාජ්‍ය වියදම් දැරීමේ සියළුම නියෝජිත ආයතන වෙත අවශ්‍ය අරමුදල් සලසාලමින් පහසුකම් සැපයීම.

- විදේශ මූල්‍යනය සහිත ව්‍යාපෘති සඳහා භාණ්ඩාගාර මට්ටමින් අරමුදල් බෙදාහැරීම සහ මූල්‍ය/ගිණුම් වාර්තාකරණය සඳහා පහසුකම් සැපයීම.

- රාජ්‍ය ආදායම ඇතුළුව සියළුම ලැබීම් භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම් නිල බැංකු ගිණුමට දෛනිකව රැස් කිරීම පහසු කරනු වස් භාණ්ඩාගාර කේවල ගිණුම් ක්‍රමය වැඩිදියුණු කිරීම / ව්‍යාප්ත කිරීම.


- ආයතනික අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා වෘත්තීයමය භාවයකින් යුක්තව නිලධාරින්ගේ කාර්ය සාධනය සහතික කරමින් දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ ධාරිතා මට්ටම වර්ධනය කිරීම.

- ආයතනයේ අවශ්‍යතාවයන් සපුරාලීම පෙරදැරිකරගෙන ජාතික / අන්තර් ජාතික ප්‍රමිත මට්ටම් ලබා ගැනීමට පහසුවන පරිදි අදාළ ප්‍රමිතීන් ආයතනික අවශ්‍යතාවයන්ට ගැලපෙන ලෙස සංශෝධනය කරමින් දෙපාර්තමේන්තු කාර්යය ශ්‍රිතයන් / ක්‍රියාවලින් ප්‍රමිතිකරණය කිරීම.

1.3 ප්‍රධාන කාර්යයන්

- භාණ්ඩාගාර මුදල් ප්‍රවාහ කළමනාකරණය.
- ගෙවීම් පද්ධතිය හරහා භාණ්ඩාගාර අරමුදල් උපයෝජනය කිරීම.
- වියදම් ආයතනවල අරමුදල් අවශ්‍යතා තක්සේරු කර ප්‍රමුඛතා මත අරමුදල් නිදහස් කිරීම.
- භාණ්ඩාගාර ඇපකර නිකුත් කිරීම.
- රජයේ උපණය අයකිරීම සහ ඊට අදාළ භාණ්ඩාගාර පොත්පත් පවත්වාගෙන යාම.
- දෙපාර්තමේන්තුව වෙත පවරා ඇති බදු නොවන ආදායම් ශීර්ෂ 12 ක් යටතේ ආදායම් ඇස්තමේන්තු කිරීම, අනෙකුත් අමාත්‍යාංශයන් දෙපාර්තමේන්තු විසින් කළ එකතු කිරීම්ද ඇතුළත්ව ආදායම් ගිණුම පිළියෙල කිරීම.
- විදේශ ආධාර ණය සහ ප්‍රදාන යටතේ ලැබෙන මුදල් අදාළ ව්‍යාපෘති වෙත නිකුත් කිරීම සඳහා පහසුකම් සැලසීම.
- විදේශ ආධාර ගිණුම් තැබීමේ ක්‍රියාවලිය සඳහා පහසුකම් සැලසීම.
- රාජ්‍ය ණය ගැනීම් හා ණය සේවා ගිණුම්ගත කිරීම.
- රජයේ බැංකු ගිණුම් සහ අග්‍රිම ගිණුම් ආරම්භ කිරීම/පවත්වාගෙන යාම සඳහා බලය දීම හා අධීක්ෂණය කිරීම.
- රාජ්‍ය නිලධාරීන්ගේ දේපල ණය ඇප යෝජනා ක්‍රමය මෙහෙය වීම.

1.4 සංවිධාන සටහන


අධ්‍යක්ෂ ජනරාල්
අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (මුදල් ප්‍රවාහ කළමනාකරණ හා ආදායම්) (ශ්‍රී ලං.ග.සේ.)
අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (රාජ්‍යාණය කළමනාකරණ හා ප්‍රතිසංස්කරණ) (ශ්‍රී ලං.ග.සේ.)
අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (ඒකාබද්ධ අරමුදල් කළමනාකරණ) (ශ්‍රී ලං.ග.සේ.)
අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පාලන,අසම්භාව්‍ය බැරකම් හා ගෙවීම් ක්‍රමවේද ප්‍රතිසංස්කරණ) (ශ්‍රී.ලං.ප.සේ.)
අධ්‍යක්ෂ (ආදායම්) (ශ්‍රී ලං.ග.සේ.)
අධ්‍යක්ෂ (මුදල් ප්‍රවාහ කළ.) (ශ්‍රී ලං.ග.සේ.)
අධ්‍යක්ෂ (දේශීය ණය) (ශ්‍රී ලං.ග.සේ.)
අධ්‍යක්ෂ (විදේශ ණය-01) (ශ්‍රී ලං.ග.සේ.)
අධ්‍යක්ෂ (දේශීය/ විදේශීය ප්‍රදාන) (ශ්‍රී ලං.ග.සේ.)
අධ්‍යක්ෂ (විදේශ ණය-02) (ශ්‍රී ලං.ග.සේ.)
අධ්‍යක්ෂ (ඒකාබද්ධ අරමුදල් කළ.) (ශ්‍රී ලං.ග.සේ.)
අධ්‍යක්ෂ (අරමුදල් මෙහෙයුම් හා ගිණුම්) (ශ්‍රී ලං.ග.සේ.)
අධ්‍යක්ෂ (උප ණය හා භාණ්ඩාගාර ඇපකර) (ශ්‍රී ලං.ග.සේ.)
නි.අ./ස.අ. (ආදායම්.) (ශ්‍රී ලං.ග.සේ.)
නි.අ./ස.අ. (මුදල් ප්‍රවාහ කළ.) (ශ්‍රී ලං.ග.සේ.)
නි.අ./ස.අ. (දේශීය ණය) (ශ්‍රී ලං.ග.සේ.)
නි.අ./ස.අ. (විදේශ ණය-01) (ශ්‍රී ලං.ග.සේ.)
නි.අ./ස.අ. (ප්‍රදාන) (ශ්‍රී ලං.ග.සේ.)
නි.අ./ස.අ. (අයවැය ක්‍රි.කි. 1) (ශ්‍රී ලං.ග.සේ.)
නි.අ./ස.අ (අයවැය ක්‍රි.කි.2) (ශ්‍රී ලං.ග.සේ.)
නි.අ./ස.අ (අයවැය ක්‍රි.කි-3) (ශ්‍රී ලං.ග.සේ.)
නි.අ./ස.අ (අයවැය ක්‍රි.කි.-4) (ශ්‍රී ලං.ග.සේ.)
නි.අ./ස.අ. (සැපයුම් හා ගිණුම්) (ශ්‍රී ලං.ග.සේ.)
නි.අ./ස.අ. (පාලන) (ශ්‍රී.ලං.ප.සේ.)
පරිපාලන නිලධාරී

1.5 දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ

- **ඒකාබද්ධ අරමුදල් කළමනාකරණ හා ගිණුම් අංශය**

  - ඒකාබද්ධ අරමුදල් කළමනාකරණ ඒකකය
  - අයවැය ක්‍රියාත්මක කිරීමේ අංක 01,02,03 සහ 04 ඒකකයන්
  - අරමුදල් මෙහෙයුම් හා ගිණුම් ඒකකය
  - සැපයුම් හා ගිණුම් ඒකකය

- **රාජ්‍ය ණය කළමනාකරණ හා ප්‍රතිසංස්කරණ අංශය**

  - විදේශ ණය 01 ඒකකය
  - විදේශ ණය 02 ඒකකය
  - දේශීය ණය ඒකකය
  - දේශීය හා විදේශීය ප්‍රදාන ඒකකය

- **මුදල් ප්‍රවාහ කළමනාකරණ හා ආදායම් අංශය**

  - මුදල් ප්‍රවාහ කළමනාකරණ ඒකකය
  - ආදායම් ඒකකය

- **පාලන, අසම්භාව්‍ය බැරකම් හා ගෙවීම් ක්‍රමවේද ප්‍රතිසංස්කරණ අංශය**

  - පාලන ඒකකය
  - උපණය හා භාණ්ඩාගාර ඇපකර කළමනාකරණ ඒකකය
  - නව ආර්ථික ප්‍රවණතා මත දෙපාර්තමේන්තු විෂය පථය සැලසුම් කිරීමේ ඒකකය
  - තොරතුරු තාක්ෂණ සංවර්ධන ඒකකය
  - හා.නි.ලේ.ගේ වත්කම් හා සුරක්ෂිතාගාර කළමනාකරණ ඒකකය

02 පරිච්ඡේදය - ප්‍රගතිය හා ඉදිරි දැක්ම

➢ **විශේෂ ජයග්‍රහණ**

I. 2016 මූල්‍ය වර්ෂය සඳහා රාජ්‍ය ගිණුම් කාරක සභාව විසින් පවත්වන ලද කාර්ය සාධන ඇගයීම් වැඩසටහනේ දෙපාර්තමේන්තු කාණ්ඩය යටතේ ලංකාවේ ප්‍රථම ස්ථානය සඳහා වූ රන් පදක්කම.

II. 2017 මූල්‍ය වර්ෂය සඳහා රාජ්‍ය ගිණුම් කාරක සභාව විසින් පවත්වන ලද කාර්ය සාධන ඇගයීම් වැඩසටහනේ දෙපාර්තමේන්තු කාණ්ඩය යටතේ ලංකාවේ ප්‍රථම ස්ථානය සඳහා වූ රන් පදක්කම දිනා ගැනීම.

III. 2018 මූල්‍ය වර්ෂය සඳහා රාජ්‍ය ගිණුම් කාරක සභාව විසින් පවත්වන ලද කාර්ය සාධන ඇගයීම් වැඩසටහනේ දෙපාර්තමේන්තු කාණ්ඩය සම්මානය.

IV. 2019 මූල්‍ය වර්ෂය සඳහා රාජ්‍ය ගිණුම් කාරක සභාව විසින් පවත්වන ලද කාර්ය සාධන ඇගයීම් වැඩසටහනේ දෙපාර්තමේන්තු කාණ්ඩය යටතේ සම්මානය ලබා ගැනීම.

V. 2020 මූල්‍ය වර්ෂය සඳහා රාජ්‍ය ගිණුම් කාරක සභාව විසින් පවත්වන ලද කාර්ය සාධන ඇගයීම් වැඩසටහනේ දෙපාර්තමේන්තු කාණ්ඩය යටතේ ඉහළ කාර්යසාධන මට්ටමක් ළඟා කර ගැනීම.

VI. 2018 වර්ෂය සඳහා දෙපාර්තමේන්තුවේ මූල්‍ය කාර්ය සාධනය මත සත්‍ය හා සාධාරණ විගණන මතයක් විගණකාධිපති වෙතින් ලබා ගැනීම.

VII. 2019 වර්ෂය සඳහා දෙපාර්තමේන්තුවේ මූල්‍ය කාර්ය සාධනය මත සත්‍ය හා සාධාරණ විගණන මතයක් විගණකාධිපති වෙතින් ලබා ගැනීම.

VIII. 2020 වර්ෂය සඳහා දෙපාර්තමේන්තුවේ මූල්‍ය කාර්ය සාධනය මත සත්‍ය හා සාධාරණ විගණන මතයක් විගණකාධිපති වෙතින් ලබා ගැනීම.

IX. 2021 වර්ෂය සඳහා දෙපාර්තමේන්තුවේ මූල්‍ය කාර්ය සාධනය මත සත්‍ය හා සාධාරණ විගණන මතයක් විගණකාධිපති වෙතින් ලබා ගැනීම.

X. 2022 වර්ෂයේ දෙපාර්තමේන්තුවේ මූල්‍ය කාර්ය සාධනය මත සත්‍ය හා සාධාරණ විගණන මතයක් විගණකාධිපති වෙතින් ලබා ගැනීම

XI. 2023 වර්ෂයේ දෙපාර්තමේන්තුවේ මූල්‍ය කාර්ය සාධනය මත සත්‍ය හා සාධාරණ විගණන මතයක් විගණකාධිපති වෙතින් ලබා ගැනීම

XII. කොවිඩ් - 19 වසංගත තත්වය යටතේ නිලධාරීන්ට නිවසේ සිට රාජකාරි කිරීමට පහසුකම් සැලසීම සඳහා මාර්ගගත පද්ධතියක් ලෙස ‘‘භාණ්ඩාගාර මූල්‍ය කළමනාකරණ පද්ධතිය’’ (TFMS) වැඩි දියුණු කිරීම.

XIII. ඒකාබද්ධ භාණ්ඩාගාර කළමනාකරණ තොරතුරු පද්ධතිය (ITMIS) යටතේ සියළුම අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු සඳහා අක්මුදල් නිදහස් කිරීම සහ එකී කාර්යයන් සාර්ථකව කළමනාකරණය කිරීම.

XIV. ශ්‍රී ලංකා රාජ්‍ය මූල්‍ය ගණකාධිකාරීවරුන්ගේ සංගමය (APFASL) විසින් සංවිධානය කරන ලද රාජ්‍ය අංශයේ දෙපාර්තමේන්තු කාණ්ඩය යටතේ 2019 වසරේ දී රාජ්‍ය අංශය සඳහා හොඳම වාර්ෂික වාර්තා සහ ගිණුම් සම්මාන උළෙලේ තෙවන ස්ථානය සඳහා ලෝකඩ සම්මානය දිනා ගන්නා ලදී.

XV. ශ්‍රී ලංකා රාජ්‍ය මූල්‍ය ගණකාධිකාරීවරුන්ගේ සංගමය (APFASL) විසින් සංවිධානය කරන ලද රාජ්‍ය අංශයේ දෙපාර්තමේන්තු කාණ්ඩය යටතේ 2020 වසරේ දී රාජ්‍ය අංශය සඳහා හොඳම වාර්ෂික වාර්තා සහ ගිණුම් සම්මාන උළෙලේ තෙවන ස්ථානය සඳහා ලෝකඩ සම්මානය දිනා ගන්නා ලදී.

XVI. ශ්‍රී ලංකා රාජ්‍ය මූල්‍ය ගණකාධිකාරීවරුන්ගේ සංගමය (APFASL) විසින් සංවිධානය කරන ලද රාජ්‍ය අංශයේ දෙපාර්තමේන්තු කාණ්ඩය යටතේ 2022 වසර සඳහා රාජ්‍ය අංශය සඳහා වූ වාර්ෂික වාර්තා සහ ගිණුම් සම්මාන උළෙලේ දී අනුකූලතා සහතිකයක් දිනා ගන්නා ලදී.

XVII. ශ්‍රී ලංකා රාජ්‍ය මූල්‍ය ගණකාධිකාරීවරුන්ගේ සංගමය (APFASL) විසින් සංවිධානය කරන ලද රාජ්‍ය අංශයේ දෙපාර්තමේන්තු කාණ්ඩය යටතේ 2023 වසරේ දී රාජ්‍ය අංශය සඳහා හොඳම වාර්ෂික වාර්තා සහ ගිණුම් සම්මාන උළෙලේ තෙවන ස්ථානය සඳහා ලෝකඩ සම්මානය දිනා ගන්නා ලදී.

අභියෝග

I කලාපයේ අනෙකුත් රටවල් විසින් හඳුන්වා දෙනු ලබන භාණ්ඩාගාර ප්‍රතිසංස්කරණ හා තොරතුරු තාක්ෂණ ක්‍රමවේදයන් නිසා මෙරටට ඇතිවන බලපෑම.

II උපාය මාර්ගික මට්ටමේ නිලධාරීන් ඇතුළු දෙපාර්තමේන්තුවේ සියළුම නිලධාරීන් වාර්ෂික ස්ථාන මාරුවීම්වලට යටත්වන දීප ව්‍යාප්ත සේවාවන්ට හා ඒකාබද්ධ සේවාවන්ට අයත් නිලධාරීන් වීම.

III රාජ්‍ය අංශ තුල පවතින ප්‍රමාණවත් වෘත්තීයමය නිපුණතාවයකින් යුත් නිලධාරීන්ගේ හිඟය හා අනුමත කාර්ය මණ්ඩලයේ පවතින පුරප්පාඩු සපුරා ගැනීමට නොහැකිවීම.

IV රට තුළ පවතින ආර්ථික අර්බුදකාරී තත්ත්වය යටතේ භාණ්ඩාගාර මුදල් ප්‍රවාහය කළමනාකරණය කර ගැනීම.

V නව මහ බැංකු පනත අනුව 2023 සැප්තැම්බර් මස සිට ක්‍රියාත්මක වන පරිදි මහ බැංකු මූල්‍යකරණය සම්පූර්ණයෙන්ම අත්හිටුවන ලද අතර මූල්‍ය වෙළඳපොළ හරහා ණය සේවාකරණය සඳහා අවශ්‍ය අරමුදල් සපයා ගැනීම මඟින් භාණ්ඩාගාර අරමුදල් ප්‍රවාහය කළමනාකරණය කර ගැනීමට සිදුවීම.

ඉදිරි ඉලක්ක

I ITMIS ව්‍යාපෘතිය තුළ භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව අදාල මොඩියුල් පූර්ණ වශයෙන් ක්‍රියාත්මක කිරීමට සහාය වීම.

II ජාතික / අන්තර්ජාතික මට්ටමේ ප්‍රමිතීන් දෙපාර්තමේන්තු අවශ්‍යතා මත ගලපා භාණ්ඩාගාර අරමුදල් කළමනාකරණ ක්‍රියාවලීන් සඳහා ප්‍රමිති සහතිකයක් ලබා ගැනීම.

III විශ්ව විද්‍යාල ඇතුළුව විවිධ ව්‍යවස්ථාපිත නොවන රාජ්‍ය ආයතන විසින් පවත්වා ගෙන යනු ලබන භාණ්ඩාගාර අරමුදල්වලට අදාල නිල බැංකු ගිණුම් සියල්ලම භාණ්ඩාගාර කේවල ගිණුම් ක්‍රමය යටතේ ක්‍රියාත්මක කිරීමට පියවර ගැනීම.

IV 2025 වසර තුළ දෙපාර්තමේන්තුව සඳහා ISO:9001:2015 ප්‍රමිත සහතිකය ලබා ගැනීම.

ඒ.එන්. හපුගල
අධ්‍යක්ෂ ජනරාල්
භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව



රාජ්‍ය ගිණුම් කාරක සභාව විසින් පවත්වනු ලබන කාර්ය සාධන ඇගයීමේ වැඩසටහනේ දී සම්මාන ලබා ගැනීම



ශ්‍රී ලංකා රාජ්‍ය මූල්‍ය ගණකාධිකාරීවරුන්ගේ සංගමය (APFASL) විසින් සංවිධානය කරන හොඳම වාර්ෂික වාර්තා සහ ගිණුම් සම්මාන උළෙලේ 2023 රාජ්‍ය අංශය (දෙපාර්තමේන්තු කාණ්ඩය) සඳහා තෙවන ස්ථානය සඳහා ලෝකඩ සම්මානය ලබා ගැනීම

03 පරිච්ඡේදය - 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්ය සාධනය

3.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

ඒසිඒ-පී

2024 දෙසැම්බර් 31 දිනට
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය

	සටහන	තත්‍ය 2024 රු.	2023 රු.
මූල්‍ය නොවන වත්කම්			
දේපළ, පිරියත හා උපකරණ	ඒසිඒ-6	99,622,955	95,279,613
මූල්‍ය වත්කම්			
අත්තිකාරම් ගිණුම්	ඒසිඒ-5/5(ඒ)	16,895,379	16,936,122
මුදල් හා මුදල් සමාන දෑ	ඒසිඒ-3	-	-
මුළු වත්කම්		**116,518,334**	**112,215,735**
ශුද්ධ වත්කම් / ස්කන්ධය			
භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම්		(5,511,957,679)	(5,710,885,717)
දේපළ පිරියත හා උපකරණ සංචිතය		99,622,955	95,279,613
කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය	ඒසිඒ-5(බී)		
ප්‍රාග්ම වගකීම්			
තැන්පතු ගිණුම්	ඒසිඒ-4	5,528,853,058	5,727,821,839
අග්‍රිම ශේෂය	ඒසිඒ-3	-	-
මුළු වගකීම්		**116,518,334**	**112,215,735**

පිටු අංක 7 සිට 35 දක්වා ඒසිඒ 1 සිට ඒසිඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් කොරතුරු සහ ඇමුණුම් පිටු අංක 36 සිට 41 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අත්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2024.12.16 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 විධිවිධානයන්ට අනුකූලව සිදුකර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් කොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් ව්‍යවස්ථාපිත ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

ප්‍රධාන ගණන්දීමේ නිලධාරි	ගණන්දීමේ නිලධාරි	
කේ.එම්.මහින්ද සිරිවර්ධන	ඒ. එන්. හපුගල	නියෝජ්‍ය අධ්‍යක්ෂ
ලේකම් - මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය	අධ්‍යක්ෂ ජනරාල්	ඩී.ඒ.එස්.දොලේවත්ත
දිනය : 2025.02. 28	දිනය : 2025.02 21	දිනය : 2025.02. 21

කේ.එම්.මහින්ද සිරිවර්ධන
මහා භාණ්ඩාගාරයේ සහ මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම්
මුදල් අමාත්‍යාංශය
කොළඹ 01.

ඒ. එන්. හපුගල
අධ්‍යක්ෂ ජනරාල්
භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තු
මහා භාණ්ඩාගාරය,
කොළඹ - 01.

ඩී. ඒ. සමන්තා දොලේවත්ත
නියෝජ්‍ය අධ්‍යක්ෂ
භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව
මහා භාණ්ඩාගාරය,
කොළඹ - 01.

3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

ඒසිඒ-පී

2024 දෙසැම්බර් 31 දිනට
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය

	සටහන	නත්‍ය 2024 රු.	2023 රු.
මූල්‍ය නොවන වත්කම්			
දේපළ, පිරියත හා උපකරණ	ඒසිඒ-6	99,622,955	95,279,613
මූල්‍ය වත්කම්			
අත්තිකාරම් ගිණුම්	ඒසිඒ-5/5(ඒ)	16,895,379	16,936,122
මුදල් හා මුදල් සමාන දෑ	ඒසිඒ-3	-	-
මුළු වත්කම්		**116,518,334**	**112,215,735**
ශුද්ධ වත්කම් / ස්කන්ධය			
භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම්		(5,511,957,679)	(5,710,885,717)
දේපළ පිරියත හා උපකරණ සංචිතය		99,622,955	95,279,613
කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය	**ඒසිඒ-5(බී)**		
ජංගම වගකීම්			
නැන්පතු ගිණුම්	ඒසිඒ-4	5,528,853,058	5,727,821,839
අග්‍රිම ශේෂය	ඒසිඒ-3	-	-
මුළු වගකීම්		**116,518,334**	**112,215,735**

පිටු අංක 7 සිට 35 දක්වා ඒසිඒ 1 සිට ඒසිඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ ඇමුණුම් පිටු අංක 36 සිට 41 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2024.12.16 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 විධිවිධානයන්ට අනුකූලව සිදුකර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් ව්‍යාර්තාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

ප්‍රධාන ගණන්දීමේ නිලධාරි කේ.එම්.මහින්ද සිරිවර්ධන ලේකම් - මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය දිනය : 2025.02. 28	ගණන්දීමේ නිලධාරි ඒ. එන්. හපුගල අධ්‍යක්ෂ ජනරාල් දිනය : 2025.02 21	නියෝජ්‍ය අධ්‍යක්ෂ ඩී.ඒ.එස්.දොලේවත්ත දිනය : 2025.02. 21

කේ.එම්.මහින්ද සිරිවර්ධන
මහා භාණ්ඩාගාරයේ සහ මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම්
මුදල් අමාත්‍යාංශය
කොළඹ 01.

ඒ. එන්. හපුගල
අධ්‍යක්ෂ ජනරාල්
භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තු
මහා භාණ්ඩාගාරය,
කොළඹ - 01.

ඩී. ඒ. සමන්තා දොලේවත්ත
නියෝජ්‍ය අධ්‍යක්ෂ
භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව
මහා භාණ්ඩාගාරය,
කොළඹ - 01.

3.3 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

ඒසීඒ-සී

2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

	2024 රු.	2023 රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
මුළු බදු ලැබීම්		
ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර	848,486	787,451
ලාභ	-	-
ආදායම් නොවන ලැබීම්	-	-
වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම්	923,242,590	903,419,608
අග්‍රිම ලැබීම්	441,186,000	867,516,512
අත්තිකාරම් අයකර ගැනීම්	8,035,201	5,509,307
තැන්පතු ලැබීම්	1,024,228	3,153,405
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)	1,374,336,505	1,780,386,283
අඩුකළා : මුදල් වැය කිරීම්		
පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්	130,136,430	110,435,210
සහනාධාර සහ මාරුකිරීම්	1,223,214,631	1,651,022,090
වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම්	624,506	2,308,118
භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම	42,876	192,754
අත්තිකාරම් ගෙවීම්	9,342,750	4,413,083
තැන්පතු ගෙවීම්	1,024,228	3,153,405
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)	1,364,385,421	1,771,524,660
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)=(අ)-(ආ)	9,951,084	8,861,623
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
පොළී	-	-
ලාභාංශ	-	-
නිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම	-	-
උපණය අයකර ගැනීම්	-	-
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)	-	-
අඩුකළා : මුදල් වැය කිරීම්		
භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කර ගැනීම්	9,951,084	8,861,623
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)	9,951,084	8,861,623
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඈ)-(ඉ)	(9,951,084)	(8,861,623)
මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=(ඇ) + (ඊ)	0	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
දේශීය ණය ගැනීම්	-	-
විදේශීය ණය ගැනීම්	-	-
ප්‍රදානයන් ලැබීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)	-	-
අඩුකළා : මුදල් වැය කිරීම්		
දේශීය ණය ආපසු ගෙවීම්	-	-
විදේශීය ණය ආපසු ගෙවීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)	-	-
මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ)+(ඒ)	-	-
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය	-	-
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය	-	-

3.4 මූල්‍ය ප්‍රකාශ සටහන්

වාර්තාකිරීමේ පදනම

1) **මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ පදනම**

මූල්‍ය ප්‍රකාශන, රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2024.12.16 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 විධිවිධානයන්ට අනුකූලව පිළියෙල කර ඇත.

2) **වාර්තාකරණ කාලපරිච්ඡේදය**

2024 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා වූ කාලපරිච්ඡේදය මෙම මූල්‍ය ප්‍රකාශනයන්ට අදාළ වාර්තාකරණ කාලපරිච්ඡේදය වේ.

3) **මිනුම්කරණ පදනම**

මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය මත පිළියෙල කර ඇති අතර සමහර වත්කම් නැවත තක්සේරු කරන ලද වටිනාකමට ඉදිරිපත් කර ඇත. අන්‍යාකාරයෙන් දක්වා නොමැති විට ගිණුම් පිළියෙල කිරීම වැඩිදියුණු කළ මුදල් පදනම මත සිදුකරයි.

මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රුපියල්වලින් ආසන්නතම රුපියලට ඉදිරිපත් කර ඇත.

4) **ආදායම් හඳුනාගැනීම**

හුවමාරු හා හුවමාරු නොවන ආදායම් ඒවා ලැබිය යුතු කාලසීමාව නොසලකා, මුදල් ලැබෙන කාලපරිච්ඡේදයේදී ආදායම් ලෙස හඳුනාගනු ලැබේ.

5) **දේපළ, පිරියත හා උපකරණ හඳුනාගැනීම හා මැනීම**

වත්කමට අදාළ අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ලැබෙන බවට තහවුරුවක් ඇති විට හා එම වත්කම විශ්වාසනීයව මැනිය හැකි නම් එම වත්කම් දේපළ, පිරියත හා උපකරණ ලෙස හඳුනාගනු ලැබේ.

දේපළ, පිරියත හා උපකරණ පිරිවැයට හඳුනාගන්නා අතර පිරිවැය ආකෘතිය අදාළ නොවන අවස්ථාවලදී නැවත තක්සේරු කරන ලද අගය යොදාගනී.

6) **දේපළ, පිරියත හා උපකරණ සංචිතය**

මෙම සංචිත ගිණුම් දේපළ, පිරියත හා උපකරණවල අනුරූප ගිණුම් වේ.

7) **මුදල් හා මුදල් සමාන දෑ**

2024 දෙසැම්බර් 31 දිනට මුදල් හා මුදල් සමාන දෑ අකැකි දේශීය ව්‍යවහාර මුදල් නෝට්ටු සහ කාසිවලින් සමන්විත වේ.


* යම් වාර්තාකරණ ආයතනයකට විශේෂිත වූ ගනුදෙනු ඇති අවස්ථාවල දී එම ආකෘතිවල අවශ්‍ය පරිදි සංශෝධනයන් සිදුකර ගත හැක. එසේම "වාර්තාකරණ පදනම්" යටතේ එම විශේෂිත ගනුදෙනු සඳහා අවශ්‍ය හෙළිදරව් කිරීම් ඇතුළත් කළ හැක.

* තම වාර්තාකරණ ආයතනයට අදාළ ගිණුම්කරණ ප්‍රතිපත්ති පමණක් වාර්තාකිරීමේ පදනම් යටතේ හෙළිදරව් කළ යුතු ය.

3.5 ආදායම එකතු කිරීමේ කාර්ය සාධනය - 2024

ආදායම් සංකේතය	විස්තරය	මුල් ආදායම් ඇස්තමේන්තුව	එකතු කරන ලද ආදායම	
			සත්‍ය ආදායම	මුල් ආදායම් ඇස්තමේන්තුවේ % ලෙස
2002.01.99	අනෙකුත් කුලී	1,000,000,000.00	1,449,660,427.35	145%
2002.02.01	ණයදීම	10,500,000,000.00	9,820,803,203.56	94%
2002.02.99	වෙනත්	3,200,000,000.00	47,942,824,583.57	1498%
2003.01.00	දෙපාර්තමේන්තුම ය විකිණීම්	102,000,000.00	201,147,768.18	197%
2003.02.99	විවිධ	6,200,000,000.00	7,018,649,574.19	113%
2003.03.02	දඩමුදල් හා රාජසන්තක කිරීම් (වෙනත්)	1,800,000,000.00	2,684,653,576.32	149%
2003.05.00	භාණ්ඩාගාර බැඳුම්කර අධිභාරය	13,479,000,000.00	13,461,749,332.96	100%
2003.99.00	අනෙකුත් ලැබීම්	10,000,000,000.00	25,672,484,075.08	257%
2005.99.00	ජාතික ලොතරැයි මණ්ඩලය හා අනෙකුත් පැවරීම්	5,000,000,000.00	5,822,902,742.23	116%
2006.04.00	ණය ආපසු අයකර ගැනීම්	8,000,000,000.00	27,841,380,589.53	348%
3001.01.00	විදේශීය ප්‍රදානයන්	19,800,000,000.00	59,841,604,761.58	302%
3001.02.00	දේශීය ප්‍රදානයන්	200,000,000.00	127,126,022.12	64%

2024 වර්ෂයේ මුල් ඇස්තමේන්තුව සංශෝධනය කිරීම සඳහා 2024.07.31 දින රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව වෙත ඉල්ලීමක් ඉදිරිපත් කර ඇත. 2025 වර්ෂයේ මුල් කාර්තුව සඳහා අතුරු සම්මත ගිණුමක් අනුමත වී ඇති බැවින් 2024 වර්ෂය සඳහා අවසන් ඇස්තමේන්තුවක් මේ වන තෙක් අනුමත වී නොමැත.



3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගි කර ගැනීමේ කාර්ය සාධනය

රු. 000

ප්‍රතිපාදන වර්ගය	වෙන් කරන ලද ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගි කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස
	මුල් ප්‍රතිපාදනය	අවසාන ප්‍රතිපාදනය		
විසර්ජන පනත				
පුනරාවර්තන	21,437,325	39,440,867	32,243,742	81.75
මූලධන	7950	11,880	10,897	91.73
ණය සේවාකරණ	4,650,000	4,650,000	4,639,336	99.77
උප එකතුව	**26,095,275**	**44,102,747**	**36,893,975**	**83.65**
විශේෂ නීති සේවා				
පුනරාවර්තන	2,634,104,400	2,741,704,400	2,684,275,674	97.91
ණය සේවාකරණ	4,263,744,700	4,625,744,700	4,614,190,637	99.75
උප එකතුව	**6,897,849,100**	**7,367,449,100**	**7,298,466,311**	**99.06**
මුළු එකතුව	**6,923,944,375**	**7,411,551,847**	**7,335,360,286**	**98.97**

3.7 මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත්අමාත්‍යාංශ /දෙපාර්තමේන්තුවල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට / දිස්ත්‍රික් ලේකම් කාර්යාලය / පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

රු. 000

අනු අංකය	ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය / දෙපාර්තමේන්තුව	ප්‍රතිපාදනයේ අරමුණ	ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගී කර ගන්නා ලද ප්‍රතිපාදන, ලබා දුන් අවසාන ප්‍රතිපාදන වල % ලෙස
			මුල් ප්‍රතිපාදන	අවසාන ප්‍රතිපාදන		
	මැතිවරණ දෙපාර්තමේන්තුව	මැතිවරණ රාජකාරි ගෙවීම්	625	625	625	100

3.8 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය

රු. 000

වත්කම් කේතය	කේත විස්තරය	**31.12.2024** දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය	**31.12.2024** දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය	ඉදිරියේදී ගිණුම්කරණයට නියමිත	ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම
9151	ගොඩනැගිලි හා ව්‍යුහයන්	-			
9152	යන්ත්‍රෝපකරණ	66,953	66,953	-	100
9153	ඉඩම්	-	-	-	
9154	අස්පෘශ්‍ය වත්කම්	-	-	-	
9155	ජීව විද්‍යාත්මක වත්කම්	-	-	-	
9160	කෙරීගෙන යන වැඩ	-	-	-	
9180	බදු දෙන ලද වත්කම්	32,670	32,670		100

3.9 විගණකාධිපතිවරයාගේ වාර්තාව

ඇමුණුම I

04. පරිච්ඡේදය - කාර්ය සාධන දර්ශක

4.1 ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම		
	100% -90%	75% -89%	50% -74%
වාර්ෂික අක්මුදල් සීමාවන් තීරණය කිරීම, එම සීමාවන් අදාළ රාජ්‍ය ආයතන වෙත දැනුම් දීමේ ක්‍රියාවලිය නිම කිරීමේ කාර්ය සාධන ප්‍රගතියේ ප්‍රතිශතය	100%		
ඉහත පරිදි ගණනය කරන ලද වාර්ෂික අක් මුදල් සීමාවන් මාසික පදනමින් සංශෝධනය කර අදාළ ආයතන වෙත දැනුම් දීමේ කාර්ය සාධන ප්‍රගතියේ ප්‍රතිශතය	100%		
දෙපාර්තමේන්තුව විසින් මාසික, ත්‍රෛමාසික, අර්ධ වාර්ෂික හා වාර්ෂිකව පිළියෙල කරනු ලබන විශේෂ ගිණුම් සාරාංශයන් සහ අදාළ වාර්තා, චක්‍රලේඛ උපදෙස් පරිදි අදාළ ආයතන වෙත නිශ්චිත දිනට හෝ එදිනට පෙර ඉදිරිපත් කිරීමේ ප්‍රගතිය ප්‍රතිශතයක් ලෙස	100%		
ඒකාබද්ධ අරමුදල කළමනාකරණය කිරීම මූලික කරගෙන භාණ්ඩාගාරය විසින් මුදල් වර්ෂය තුළ පවත්වනු ලබන භාණ්ඩාගාර මුදල් ප්‍රවාහ රැස්වීම් ගණන සහ එම රැස්වීම් වලදී ගනු ලබන තීරණ ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය ප්‍රතිශතයක් ලෙස	100%		



05. පරිච්ඡේදය - තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය -2024

5.1 හඳුනා ගන්නා ලද තිරසර සංවර්ධන අරමුණු දක්වන්න

අරමුණ	ඉලක්ක	ජයග්‍රහණ දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය		
			0% - 49%	50% - 74%	75% - 100%
වාර්ෂික අයවැය සත්‍ය අරමුදල් ගලා ඒම සහ ගලා යාම බවට පත් කරමින් ඒකාබද්ධ අරමුදල් කළමනාකරණය කිරීම	අදාල පාර්ශවකරුවන් සමග සාමූහිකත්වයෙන්/ සම්බන්ධීකරණයෙන්, ආර්ථිකව, කාර්යක්ෂම හා ඵලදායීව භාණ්ඩාගාර අරමුදල් ප්‍රවාහය කළමනාකරණය කිරීම	පැවැත්විය යුතු රැස්වීම් සංඛ්‍යාව - 12 වර්ෂය තුල පවත්වන ලද අරමුදල් ප්‍රවාහ රැස්වීම් සංඛ්‍යාව -11			92%
උපණය වලට අදාල ණය වාරික හා පොළී නියමිත දිනට අයකර ගැනීමට කටයුතු කිරීම	අයවිය යුතු සියළුම ණය වාරික හා පොළී මුදල් අයකර ගැනීම	දෙපාර්තමේන්තු ඇස්තමේන්තුව අනුව අයකර ගත යුතු හා අයකරගත් ණය වාරික හා පොළී ප්‍රතිශතය **I. වාරික** අයකරගත යුතු රු. 27,750,000,000.00 / අයකර ගත් රු. 27,841,168,922.88 **II. පොලිය** අයකර ගත යුතු රු. 9,870,000,000.00 / අයකර ගත් රු. 9,821,014,870.21			100% 100%
වියදම් දැරීමේ ආයතන වලට නියමිත අධිකාරියෙන් නව බැංකු ගිණුම් හා අග්‍රිම ගිණුම් ආරම්භ කිරීමට නිසි අනුමැතිය ලබා දීම හා ඒවා අධීක්ෂණය කිරීම.	නව බැංකු ගිණුම් හා අග්‍රිම ගිණුම් විවෘත කිරීමට ඉදිරිපත් කරනු ලබන සුදුසු ඉල්ලීම් සඳහා බලය දීම තහවුරු කර ගැනීම	ලද අයදුම්පත් වලින් අනුමත කරන ලද අයදුම්පත් සංඛ්‍යාව **ලැබීම්- 101** **අනුමැතිය** - 101			100%

රජයේ නිලධාරීන්ගේ ණය ඇපකර යෝජනා ක්‍රමය යටතේ සුදුසුකම් ලබන සියළුම රජයේ නිලධාරීන්ගේ නොගෙවා ඇති ණය ශේෂයන් පියවීම	සුදුසුකම් ලබන සහ සම්පූර්ණ කරන ලද ණය අයදුම්පත් නියමිත ක්‍රියාවලියෙන් පසු සතියක් ඇතුලත ගෙවා නිම කිරීම	සතියක් තුල නිරවුල් කරන ලද අයදුම්පත් සංඛ්‍යාවේ ප්‍රතිශතය			100%

සටහන

දෙපාර්තමේන්තුව මගින් හඳුනාගෙන ඇති ඉහත අරමුණු, තිරසර සංවර්ධන වැඩසටහන යටතේ වන අංක 1 සිට 17 දක්වා වන අරමුණු අතරින් අංක 16 දක්වා වන අරමුණු සඳහා වක්‍රාකාරයෙන් භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව විසින් සිදුකරනු ලබන දායකත්වය ඉහතින් දක්වා ඇත.

5.2 පරිච්ඡේදය - තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහන හා අභියෝග සැකෙවින් විස්තර කරන්න.


තිරසර සංවර්ධන වැඩසටහන යටතේ හඳුනාගන්නා ලද ඉහත ඉලක්ක වර්ෂය තුලදී ඉහත පරිදි ඉෂ්ඨ කරගත් නමුදු ආර්ථික,දේශපාලනික, සමාජීය, නෛතික, තාක්ෂණික සහ පාරිසරික සාධක වලින් පැන නගින අභ්‍යන්තර හා බාහිර තත්ත්වයන් රජයේ අරමුදල් ප්‍රවාහය පාලනය කරනු ලබන භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට අවශෝෂණය කර ගැනීමට සිදුවන බව නිරීක්ෂණය වේ.



06. පරිච්ඡේදය - මානව සම්පත් පැතිකඩ

6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය (2024.12.31)

සේවා මට්ටම	අනුමත සේවක සංඛ්‍යාව	පවතින සේවක සංඛ්‍යාව	ඇබෑර්තු / (අතිරික්ත)**
ජ්‍යෙෂ්ඨ	25	18	07
තෘතියික	01	01	-
ද්විතියික	82	69	13
ප්‍රාථමික	20	12	08



06.2 ** ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තයට බලපානු ලැබ ඇත්තේ කෙසේදැයි කෙටියෙන් සඳහන් කරන්න.

අනුමත කාර්ය මණ්ඩලයට සාපේක්ෂව තත්‍ය සේවක සංඛ්‍යාව අඩු බැවින් පුරප්පාඩු සංඛ්‍යාව ඉහළ යාම නිසා දෙපාර්තමේන්තුව සතු මානව සම්පත උපාය මාර්ගිකව අභිප්‍රේරණය කරමින් කළමනාකරණය කර දෙපාර්තමේන්තු අරමුණු ළඟා කර ගැනීම ඍජුවම හා දැඩි ලෙස අභියෝගකාරී වීම.

තත්‍ය කාර්ය මණ්ඩලය කාර්තු වශයෙන් වෙනස් වීම පහත පරිදි වේ.

කාර්තුව	කාර්ය මණ්ඩලය	ජ්‍යෙෂ්ඨ	තෘතීය	ද්විතීක	ප්‍රාථමික	එකතුව
පළමු කාර්තුව	අනුමත	25	01	82	20	128
	ආරම්භක තත්‍ය	16	01	67	15	99
	ස්ථාන මාරුවී පැමිණි	03	-	05	01	09
	ස්ථාන මාරුවී ගිය	01	-	01	01	03
	තත්‍ය	18	01	71	15	105
	පුරප්පාඩු	**07**	**-**	**11**	**05**	**23**
දෙවන කාර්තුව	අනුමත	**25**	**01**	**82**	**20**	**128**
	ආරම්භක තත්‍ය	18	01	71	15	105
	ස්ථාන මාරුවී පැමිණි	01	-	01	-	02
	ස්ථාන මාරුවී ගිය	-	-	-	-	-
	තත්‍ය	19	01	72	15	107
	පුරප්පාඩු	**06**	**-**	**10**	**05**	**21**
තෙවන කාර්තුව	අනුමත	**25**	**1**	**82**	**20**	**128**
	ආරම්භක තත්‍ය	19	01	72	15	107
	ස්ථාන මාරුවී පැමිණි	-	-	02	01	03
	ස්ථාන මාරුවී ගිය	-	-	05	01	06
	විශ්‍රාම	01	-	-	-	01
	තත්‍ය	18	1	69	15	103
	පුරප්පාඩු	**07**	**-**	**13**	**05**	**25**
සිව්වන කාර්තුව	අනුමත	**25**	**1**	**82**	**20**	**128**
	ආරම්භක තත්‍ය	18	01	69	15	103
	ස්ථාන මාරුවී පැමිණි	02	-	03	-	01
	ස්ථාන මාරුවී ගිය	02	-	03	03	02
	තත්‍ය	18	1	69	12	100
	පුරප්පාඩු	**07**	**-**	**13**	**08**	**28**

6.3 මානව සම්පත් සංවර්ධනය

2024 වර්ෂය තුළ පවත්වන ලද දේශීය පුහුණු වැඩසටහන්

වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩ සටහන් කාල සීමාව	සමස්ථ ආයෝජනය		වැඩසටහනේ ස්වභාවය (දේශීය/ විදේශීය)	නිමවුම / ලබා ගත් දැනුම
			දේශීය (රු.)	විදේශීය (ඇ.ඩො.)		
රියදුරු මහතුන් සඳහා මාර්ග නීති සම්බන්ධ දැනුවත් කිරීමේ පුහුණු වැඩසටහන	80	පැය 03	රු. 1800/-	-	දේශීය	නිලධාරීන් වෙත ලබා දුන් පුහුණු මගින් උපයාගත් දැනුම , නිපුණතාවය , පළපුරුද්ද , න්‍යායාත්මකව හා ප්‍රායෝගිකව කාර්ය සාධනය ඉහල නංවමින් ආයතනික අරමුණු ළඟා කර ගැනීමට යෙදවීම
රජයේ නිලධාරීන්ගේ නිවාඩු සම්බන්ධ දේශනය	89	පැය 03	-	-	දේශීය	
උප ණය හා භාණ්ඩාගාර ඇපකර සම්බන්ධ දේශනය	89	පැය 02	-		දේශීය	
රියදුරු මහතුන් සඳහා දෙමුහුන් වාහන හා නවීන වාහන ධාවනය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන	91	පැය 03	රු. 1800/-	-	දේශීය	
අමාත්‍යාංශ , දෙපාර්තමේන්තු සඳහා වාර්ෂික අක් මුදල් නිදහස් කිරීම සම්බන්ධ දේශනය	89	පැය 02	-	-	දේශීය	
අරමුදල් මෙහෙයුම් හා ගිණුම් අංශයේ කාර්ය භාරය පිළිබඳ දේශනය	89	පැය 02	-		දේශීය	
‘‘ශ්‍රී ලංකාව තුළින් අල්ලස හා දූෂණය වැලැක්වීම සඳහා වන පස් අවුරුදු ජාතික ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කිරීම ’’ සම්බන්ධ පුහුණු වැඩසටහන	84	පැය 02	-	-	දේශීය	
අය වැය ක්‍රියාත්මක කිරීම් අංශ 01 හි කාර්ය භාරය දැනුවත් කිරීමේ වැඩසටහන	82	පැය 02	-	-	දේශීය	
Excel (Basic) පුහුණු වැඩසටහන	සහභාගී වූ 05 මාර්ගගත 55	පැය 03	-	-	දේශීය	
ධනාත්මක ආකල්ප සංවර්ධනය	මාර්ගගත 40	පැය 03	-	-	දේශීය	

විගණනය පිළිබඳ මූලික දැනුම	මාර්ගගත 32	පැය 03				නිලධාරීන් වෙත ලබා දුන් පුහුණු මගින් උපයාගත් දැනුම , නිපුණතාවය , පළපුරුද්ද , න්‍යායාත්මකව හා ප්‍රායෝගිකව කාර්ය සාධනය ඉහල නංවමින් ආයතනික අරමුණු ළඟා කර ගැනීමට යෙදවීම
රාජ්‍ය ආයතන සඳහා තොරතුරු හා සයිබර් ආරක්ෂාව පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන	මාර්ගගත 30	පැය 03	-	-	දේශීය	
ඉන්වෙන්ටිරි නඩත්තුව, තොග පාලනය හා ගබඩා පාලනය පිළිබඳ පුහුණු වැඩසටහන	මාර්ගගත 22	පැය 03	-	-	දේශීය	
විශ්‍රාම වැටුප් සකස් කිරීම පිළිබඳ පුහුණු වැඩසටහන	මාර්ගගත 22	පැය 03	-	-	දේශීය	
ලිපිගොණුකරණය	මාර්ගගත 28	පැය 03	-	-	දේශීය	
මූලික විමර්ශන පිළිබඳ පුහුණු වැඩසටහන	මාර්ගගත 28	පැය 03	-	-	දේශීය	
නවීන පරිගණක දැනුම හා තොරතුරු තාක්ෂණය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන	මාර්ගගත 20	පැය 03	-	-	දේශීය	
මුදල් විශුද්ධිකරණය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන	13	පැය 01 1/2	-	-	දේශීය	
ISO- 9001-2015 ප්‍රමිතිකරණ සහතිකය ලබා ගැනීම පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන	100	පැය 02 1/2	-	-	දේශීය	
‘‘රැකියාවයි සුවබර දිවියයි’’ දැනුවත් කිරීමේ වැඩසටහන	83	පැය 03 1/2	රු. 1800/-	-	දේශීය	
‘‘කෘතීම බුද්ධිය’’ පිළිබඳ දැනුවත් කිරීම	92	පැය 03	රු. 3000/-	-	දේශීය	
Macroeconomic Foundation Course (IMF)	01	දින 04	-	-	දේශීය	
සටහන් ලිවීම හා ලිපිගොණුකරණය	86	පැය 02	රු. 4000/-	-	දේශීය	
ගබඩා කළමනාකරණය හා ඉන්වෙන්ට්‍රි ලේඛන පවත්වාගෙන යාම	77	පැය 03	රු. 6000	-	දේශීය	

රජයේ නිලධාරීන් දැනුවත් විය යුතු නීති	85	පැය 03	රු. 6000/- (ආයතනික ගාස්තු ලෙස 3200/-)	-	දේශීය	
‘‘විගණනයේ වැදගත්කම හා විගණන පනතේ නව සංශෝධන’’ දැනුවත් කිරීමේ වැඩසටහන	70	පැය 03	රු. 3000/-	-	දේශීය	නිලධාරීන් වෙත ලබා දුන් පුහුණු මගින් උපයාගත් දැනුම , නිපුණතාවය , පළපුරුද්ද , න්‍යායාත්මකව හා ප්‍රායෝගිකව කාර්ය සාධනය ඉහල නංවමින් ආයතනික අරමුණු ළඟා කර ගැනීමට යෙදවීම
අයවැය ක්‍රියාත්මක කිරීමේ අංශවලට අදාළව ITMIS මොඩියුල භාවිතය	13	පැය 02	-	-	දේශීය	
විදේශීය ණය අංශයේ කාර්ය භාරය පිළිබඳ දේශනය	57	පැය 03	-	-	දේශීය	
ඒකාබද්ධ අරමුදල් කළමණාකරන අංශයේ කාර්ය භාරය පිළිබඳ දේශන	78	පැය 03	-	-	දේශීය	
දේශීය විදේශීය ප්‍රදාන අංශයේ කාර්ය භාරය පිළිබඳ දේශනය	78	පැය 03	-	-	දේශීය	
දේශීය ණය සහ ආදායම් අංශයේ කාර්ය භාරය පිළිබඳ දේශනය	67	පැය 03	-	-	දේශීය	
මුදල් ප්‍රවාහ කළමණාකරන අංශයේ කාර්ය භාරය පිළිබඳ දේශනය	63	පැය 02	-	-	දේශීය	



2025 වසර තුළ දෙපාර්තමේන්තුව සඳහා ISO:9001:2015 ප්‍රමිති සහතිකය ලබා ගැනීම සම්බන්ධව නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහන



‘‘ කෘතීම බුද්ධිය’’ පිළිබඳ නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහන

2024 වර්ෂයේ දෙපාර්තමේන්තු නිලධාරීන් සහභාගී වූ විදේශීය පුහුණු වැඩසටහන්

වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩ සටහනේ කාල සීමාව	සමස්ථ ආයෝජනය		වැඩසටහනේ ස්වභාවය (දේශීය/ විදේශීය)	නිමවුම / ලබා ගත් දැනුම
			දේශීය (රු.)	විදේශීය (ඇ.ඩො.)		
China enhancing performance of Young officials in Developing Countries - චීනය	01	දින 12		375	විදේශීය	නිලධාරීන් වෙත ලබා දුන් පුහුණු මගින් උපයාගත් දැනුම ,නිපුණතාවය , පළපුරුද්ද , න්‍යායාත්මකව හා ප්‍රායෝගිකව කාර්ය සාධනය ඉහල නංවමින් ආයතනික අරමුණු ළඟා කර ගැනීමට යෙදවීම
Seminar on Barrier Free Access for Senior - level professionals under the Belt and Road Initiative - චීනය	01	දින 13		375	විදේශීය	
Seminar on Young Diplomat from Sri Lanka - චීනය	01	දින 14		375	විදේශීය	
ADB: 2023 Asian Regional Public Debt Management Forum - චීනය	01	දින 03		125	විදේශීය	
Seminar on Smart customs, smart Borders and Smart Connectivity - චීනය	01	දින 23		375	විදේශීය	
First Mid-career training programme for Island services officers of Sri Lanka - ඉන්දියාව	02	දින 12		325	විදේශීය	
Seminar on Financial & Financial cooperation management for BRI countries - චීනය	02	දින 14		750	විදේශීය	
IMF Legal Department's 2024 work shop - සිංගප්පූරුව	01	දින 03		100	විදේශීය	
Debt management facility stakeholders Forum - සැම්බියාව	01	දින 02		100	විදේශීය	

Seminar on Tax system for BRI partner Countries project profile - චීනය	01	දින 14		375	විදේශීය	නිලධාරීන් වෙත ලබා දුන් පුහුණු මගින් උපයාගත් දැනුම ,නිපුණතාවය , පළපුරුද්ද , න්‍යායාත්මකව හා ප්‍රායෝගිකව කාර්ය සාධනය ඉහල නංවමින් ආයතනික අරමුණු ළඟා කර ගැනීමට යෙදවීම
Seminar on Optimization of Business Environment for chambers of commerce and Industry BRI Countries චීනය	01	දින 14		375	විදේශීය	
ADB: 2024 Asian Regional Forum - ජපානය	01	දින 04		125	විදේශීය	
Seminar on Financial Strategy for the BRI Partner Countries - චීනය	01	දින 09		225	විදේශීය	
Developing a Medium term management debt Strategy (SARTTAC) ඉන්දියාව	01	දින 05		150	විදේශීය	
Cash Management and Treasury Single Account - ඉන්දියාව	06	දින 05		900	විදේශීය	
Seminar on Application and management of PPI Mode for Sri Lanka චීනය	01	දින 14		375	විදේශීය	
Public Debt management Capacity Building Programme offered by NEDA - තායිලන්තය	02	දින 05		150	විදේශීය	



Cash Management and Treasury Single Account - India

❖ **ආයතනයේ කාර්ය සාධනය උදෙසා පුහුණු වැඩසටහන් දායක වන්නේ කෙසේද යන්න කෙටියෙන් පැහැදිලි කරන්න.**

වාර්ෂික මානව සම්පත් සැලසුම අනුව කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම දැනුම, කුසලතා හා ආකල්ප වර්ධනය වෙනුවෙන් පුහුණු වැඩසටහන් පවත්වන ලදී. දිවා විවේක පුහුණු වැඩසටහන් මාලාව යටතේ මෙම දෙපාර්තමේන්තුවට සුවිශේෂී වූ තාක්ෂණික විෂයයන් පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් සහ කාලීන වශයෙන් වැදගත් මාතෘකා සම්බන්ධ දැනුවත් කිරීමේ වැඩසටහන් ද පවත්වන ලදී.

එසේම, දෙපාර්තමේන්තු විෂය පථයට අදාළව පැවති විවිධ විදේශ පුහුණු වැඩමුළු සහ සම්මන්ත්‍රණ 16ක් සඳහා නිලධාරීන් 24 දෙදෙනෙකු සම්බන්ධ කිරීමට හැකි විය. එම විදේශ වැඩමුළු සඳහා සහභාගී වූ සෑම නිලධාරියෙකුටම තමා ලබාගත් දැනුම කාර්ය මණ්ඩලයේ නිලධාරීන් සමඟ හුවමාරු කර ගැනීම සඳහා අවස්ථාව ලබා දී ඇත. සියළු පුහුණු වැඩසටහන් රාජ්‍ය වියදම් පාලනය කිරීමට අදාළ චක්‍රලේඛවලට අනුකූලව සිදු කරන ලදී.

මෙම සියළු දේශීය සහ විදේශීය වැඩසටහන් මඟින් නිලධාරීන්ගේ විෂයය කරුණු පිළිබඳ දැනුම හා කුසලතා මෙන්ම ආකල්ප සංවර්ධනය කිරීමට බලාපොරොත්තු වූ අතර එමඟින්, ව්‍යක්තීමය නිපුණතාවයන් හා කුසලතාවයන්ගෙන් පූර්ණ වූ ද කාර්ය මණ්ඩලයක් ඇති කරගනිමින් කාර්යක්ෂම හා ගුණාත්මක සේවයක් ලබා දෙමින් 2024 වර්ෂය තුළ දෙපාර්තමේන්තුව වෙත පැවරුණු අභියෝග හා ඉලක්ක පහසුවෙන් ජය ගැනීමට හැකි විය.

07. පරිච්ඡේදය - අනුකූලතා වාර්තාව

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ.)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
01	**පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ / ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ.**			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	අනුකූල වේ		
1.2	රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම	අනුකූල වේ		
1.3	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම (වාණිජ අත්තිකාරම් ගිණුම්)	අදාළ නොවේ		
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම්	අදාළ නොවේ		
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම්	අදාළ නොවේ		
1.6	වෙනත්	අදාළ නොවේ		
02	**පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ. 445)**			
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.2	පුද්ගල පඩිනඩි ලේඛන / පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.5	සියළුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
2.6	චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.8	තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.9	භානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		

2.10	බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.11	උප පත්‍රිකා පොත් ලේඛනය (GA-N20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
03	**මූල්‍ය පාලනය සඳහා කාර්යයන් අභිනියෝජනය කිරීම (මු.රෙ. 135)**			
3.1	මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරා දී තිබීම	අනුකූල වේ		
3.2	මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම	අනුකූල වේ		
3.3	සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරා දී තිබීම	අනුකූල වේ		
3.4	2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේ දී ගණකාධිකාරිවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම	අනුකූල වේ		
04	**වාර්ෂික සැලසුම් සකස් කිරීම**			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.4	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
05	**විගණන විමසුම්**			
5.1	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියළුම විගණන විමසුම්වලට පිළිතුරු ලබා දී තිබීම	අනුකූල වේ		
06	**අභ්‍යන්තර විගණනය**			
6.1	මු.රෙ. 134(2), DMA/1-2019 අනුව, වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළ දී පිළිතුරු සපයා තිබීම	අනුකූල වේ		
6.3	2018 අංක 19 දරණ ජාතික විගණන වාර්තාවල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		

6.4	මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
07	**විගණන හා කළමනාකරණ කමිටු**			
7.1	කළමනාකරණ සේවා චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04 ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම	අනුකූල වේ		
08	**වත්කම් කළමනාකරණය**			
8.1	අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිළ දී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත්කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තා කර තිබීම	අනුකූල වේ		
8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණයවූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම	අනුකූල වේ		
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ. 772 අනුව සිදු කිරීම	අනුකූල වේ		
09	**වාහන කළමනාකරණය**			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
9.2	වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයක දී අපහරණය කර තිබීම.	අනුකූල වේ		
9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ		
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ. 103,104,109 හා 110 ප්‍රකාරව කටයුතු කිරීම	අනුකූල වේ		
9.5	2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1	අනුකූල වේ		

	ඡේදයේ සඳහන් විධිවිධාන ප්‍රකාරව, වාහනවල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම			
9.6	කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත් වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම.	අදාල නොවේ		
10	**බැංකු ගිණුම් කළමනාකරණය**			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙළ කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ		
10.2	සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂවල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම.	අනුකූල වේ		
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශවලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයත් ඇතුළත නිරවුල් කර තිබීම.	අනුකූල වේ		
11	**ප්‍රතිපාදන උපයෝජනය**			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම.	අනුකූල වේ		
11.2	මු.රෙ. 94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එළඹීම.	අනුකූල වේ		
12	**රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම**			
12.1	සීමාවන්වලට අනුකූල වීම.	අනුකූල වේ		
12.2	හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම.	අනුකූල වේ		
12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම.	අනුකූල වේ		
13	**පොදු තැන්පත් ගිණුම**			
13.1	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර තිබීම	අනුකූල වේ		
13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ		
14	**අග්‍රිම ගිණුම**			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම.	අනුකූල වේ		

14.2	මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම.	අනුකූල වේ		
14.3	මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම	අනුකූල වේ		
14.4	අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම.	අනුකූල වේ		
15	**ආදායම් ගිණුම**			
15.1	අදාළ රෙගුලාසි වලට අනුකූලව, රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම.	අනුකූල වේ		
15.2	රැස්කර තිබූ ආදායම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම.	අනුකූල වේ		
15.3	මු.රෙ. 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ		
16	**මානව සම්පත් කළමනාකරණය**			
16.1	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම.	අනුකූල වේ		
16.2	කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබා දී තිබීම.	අනුකූල වේ		
16.3	20.09.2017 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ		
17	**මහජනයා වෙත තොරතුරු ලබාදීම**			
17.1	තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත්කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ		
17.2	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/චෝදනා පළ කිරීමට පහසුකම් සලසා තිබීම.	අනුකූල වේ		
17.3	තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ		

18	**පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම**			
18.1	අංක 05/2008 හා 05/2018(1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛz අනුව පුරවැසි / සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම.	අනුකූල වේ		
18.2	එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි / සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම.	අනුකූල වේ		
19	**මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම**			
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 හි ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම.	අනුකූල වේ		
19.2	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම.	අනුකූල වේ		
19.3	ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම.	අනුකූල වේ		
19.4	ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙළ කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත්කොට තිබීම.	අනුකූල වේ		
20	**විගණන ඡේදවලට ප්‍රතිචාර දැක්වීම**			
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කළ විගණන ඡේද මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම.	අනුකූල වේ		

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } ටීපීඩී/ඒ/ටීඕඩී/එෆ්ඒ/2024/14 | ඔබේ අංකය / உமது இல. / Your No. } | දිනය / திகதி / Date } 2025 මැයි 31 දින

ගණුන්දීමේ නිලධාරි

භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව

ශීර්ෂය -249 භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය

ශීර්ෂය -249 භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ගණුන්දීමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව යථා කාලයේදී ඉදිරිපත් කරනු ලැබේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලින්, මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ, මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන් 1හි සඳහන් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනමට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය ඉඩ.

1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 කරුණක් අවධාරණය කිරීම - මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම විස්තර කරන මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන් 1 කෙරෙහි අවධානය යොමු කරවමි. මූල්‍ය ප්‍රකාශන රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුව භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ, මහා භාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ අවශ්‍යතාවය සඳහා සකස් කර ඇත. එම නිසා, මෙම මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා සුදුසු නොවිය හැක. මගේ වාර්තාව භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව මහා භාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ භාවිතය සඳහා පමණක් අරමුණු කර ඇත. මෙම කරුණ සම්බන්ධයෙන් මගේ මතය විකරණය කරනු නොලැබේ.

1.4 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ගණන්දීමේ නිලධාරීගේ වගකීම

රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායීත්වය පිළිබඳව කලින් කල

සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායී ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

2. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වී තිබුණි.

(ආ) ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

3. මූල්‍ය සමාලෝචනය

3.1 ආදායම් කළමනාකරණය

(අ) මූලික ඇස්තමේන්තුව, සත්‍ය ආදායම සමඟ සැසඳීමේදී ආදායම් සංකේත 11 කට අදාළව සියයට 6 ක අඩුවීමක සිට සියයට 1398 ක වැඩිවීමක් දක්වා පරාසය තුල වෙනස් වී තිබිණි.

(ආ) 2024 දෙසැම්බර් 31 දිනට ආදායම් සංකේතාංක 5 කට අදාළව හිඟ හිටි ආදායම රු.2,376,435,947 ක් වූ අතර, ඉන් වසරකට වඩා වැඩි හිඟ හිටි ආදායම රු.2,230,969,063 ක් වී තිබුණි. තවද, වසරකට වඩා වැඩි හිඟ හිටි ආදායම් ශේෂය තුල රු.2,226,572,432 ක එනම්, සියයට 99.8 ක ශේෂය වසර 3 කට වඩා වැඩි හිඟ හිටි ආදායම් ශේෂ බව තවදුරටත් නිරීක්ෂණය විය.

(ඇ) 2023 දෙසැම්බර් 31 දිනට වූ මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති හිඟ ආදායමට සාපේක්ෂව 2024 දෙසැම්බර් 31 දින වන විට සමස්ත හිඟ හිටි ආදායම සියයට 100 අඩුවීමේ සිට සියයට 656 ක වැඩිවීමක් දක්වා වූ පරාසයක විචලනය වී තිබුණි.

(ඈ) ආදායම් සංකේත අංක 2003.02.99 යටතේ 2023 දෙසැම්බර් 31 ට පැවති රු. 540,981 ක හිඟ ආදායම් ශේෂය 2024 දෙසැම්බර් 31 දින වන විට රු.4,087,297 කින් හෙවත් සියයට 656 කින් ඉහළ ගොස් තිබුණි.

(ඉ) ආදායම් සංකේත අංක 20.06.04.00 ප්‍රාග්ධන ආදායම් - ණය ආපසු අයකර ගැනීම් යටතේ සී/ස බදුල්ල දිස්ත්‍රික් සණස සංගමයට අදාළව රු.111,114,479 ක හිඟ හිටි ආදායම් ශේෂයක් සහ ආදායම් සංකේත අංක 20.02.02.01 පොළිය - ණය දීම් යටතේ ශ්‍රී ලංකා රබර් නිෂ්පාදන හා අපනයන සංස්ථාවට හා සී/ස බදුල්ල දිස්ත්‍රික් සණස සංගමයට අදාළව පිළිවෙලින් රු.612,893,552 ක් හා රු.2,814,035 ක් සහ සර්වෝදය

ආර්ථික ව්‍යවසාය සංවර්ධන සේවා (ගැරන්ටි) ලිමිටඩ් සඳහා වූ රු.296,351,801 ක් වශයෙන් එකතුව රු.912,059,388 ක හිඟ පොළී ආදායමක්ද, 2018 වර්ෂයට පෙර සිට ඉදිරියට එමින් පැවති අතර, මෙම ආදායම අයකර ගැනීම පිළිබඳව අවිනිශ්චිතභාවයක් පවතින බවද තවදුරටත් නිරීක්ෂණය විය.

3.2 වියදම් කළමනාකරණය

(අ) පුනරාවර්තන වැය විෂයන් 18 ක් සහ ප්‍රාග්ධන වැය විෂයන් 02 ක් සඳහා අධි ප්‍රතිපාදන සැලසීම හේතුවෙන් එම ප්‍රතිපාදන වර්ෂය තුල උපයෝජනය කල පසු රු.63,850,948,140 ක ඉතිරියක් පැවති අතර, එම ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 9 සිට සියයට 69 අතර පැවතුණි.

(ආ) මූලික වියදම් ඇස්තමේන්තුව හා ශුද්ධ ප්‍රතිපාදනය සැසඳීමේදී වැය විෂයන් 16 කට අදාළව විචලතාවය සියයට 100 අඩුවීමේ සිට සියයට 917 ක වැඩිවීම දක්වා පරාසයක් තුල වෙනස්ව තිබුණි.

3.3 තැන්පතු

විදේශ ප්‍රදාන ලැබීම්වලට අදාළ ගිණුම් 10 ක්, තෙවන පාර්ශවය වෙත නැවත ගෙවීම් කිරීම වෙනුවෙන් තාවකාලිකව රඳවා ගන්නා තැන්පතු ගිණු 02 ක් හා දේශීය ප්‍රදාන ලැබීම් වලට අදාළ තැන්පතු ගිණුමක් ලෙස එකතුව රු.මිලියන 335 ක් වූ තැන්පත් ගිණුම් 13 ක් සමාලෝචිත වර්ෂය තුළ ගනුදෙනු කිසිවක් නොවී පවත්වාගෙන යන ගොස් තිබුණි.

3.4 ගණන්දීමේ නිලධාරි විසින් සිදු කළ යුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරි සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදුකර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

4 මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්යසාධනය

ශ්‍රී ලංකා රජය වෙනුවෙන් ණය ලබා ගැනීම් හා ණය ආපසු ගෙවීම් ගිණුම්ගත කිරීම, රජයට විදේශ ණය ආධාර සහ ප්‍රදාන ලෙස ලැබෙන අරමුදල් විධිමත්ව බෙදා හැරීම, දේශීය හා විදේශීය වාණිජ ණය ලබාගැනීමට රජයට අවශ්‍ය පහසුකම් සැලසීම, උප ණය දීමේ වැඩසටහන් වලට අදාළ අරමුදල් ප්‍රවාහ නඩත්තු කිරීම හා රාජ්‍ය ව්‍යවසායන්වලට ණය ලබා ගැනීමේදී අවශ්‍ය භාණ්ඩාගාර ඇපකර හා සහන ලිපි නිකුත් කිරීම භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට පැවරී ඇති මූලික වගකීමක් වේ. එසේ වුවද දෙපාර්තමේන්තුව විසින් එම කාර්යභාරය සාධනීය ලෙස ඉටු නොකළ අවස්ථා නිරීක්ෂණය විය.

(අ) ගිණුම්ගත නොවූ විදේශ ණය

රජයේ මූල්‍ය ප්‍රකාශන වල පැහැදිලි කිරීමේ සටහන් 02 (Explanatory Notes) යටතේ 2024 දෙසැම්බර් 31 දිනට ගිණුම්ගත නොකළ විදේශීය ණය වටිනාකම රු.මිලියන 1,070 ලෙස දක්වා තිබුණද භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව විසින් සමාලෝචිත වර්ෂයේ දී ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව ඒවායේ ප්‍රතිලබ්ධි කාලයන් හි පහත වෙනස්කම් නිරීක්ෂණය විය.

ණය අංකය	මූල්‍ය ප්‍රකාශනය අනුව ප්‍රතිලබ්ධි වූ කාලය	භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ තොරතුරු අනුව ප්‍රතිලබ්ධි වූ කාලය
2012017	2020 දෙසැම්බර්	2024
2012025	2023 නොවැම්බර්	2024
2016035	2022 සැප්තැම්බර්	2022 සැප්තැම්බර් 2023 මාර්තු සහ සැප්තැම්බර්

භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව විසින් 2020 සිට 2023 වර්ෂය දක්වා විගණනය වෙත ඉදිරිපත් කර තිබූ තොරතුරු අනුව, ඉහත දක්වා ඇති ණය ප්‍රතිලබ්ධිවී තිබූ බව දක්වා නොතිබුණි. ඒ අනුව, එකම ණය ගනුදෙනුවකට අදළව එකිනෙකට පරස්පර තොරතුරු විගණනයට ඉදිරිපත් කර තිබූ අතර ඒ ඒ වගකීම් පැවරූ දෙපාර්තමේන්තු විසින් විදේශ ණය ප්‍රතිලබ්ධිවීම පිළිබඳව විධිමත් හා යාවත්කාලීන තොරතුරු පවත්වාගෙන නොමැති බව අනාවරණය විය. තවද, විදේශීය ණය වාර්තා කරනු ලබන පද්ධතියේ Stock and Flow Report No.1 වාර්තාව අනුවද ඉහත ණය පිළිබඳව විධිමත් හා යාවත්කාලීන තොරතුරු පවත්වා ගෙන නොතිබුණි. ඒ අනුව, ඉහත විදේශීය ණය ගණුදෙනුවලට අමතරව විධිමත් ලෙස වාර්තා නොවූ වෙනත් විදේශීය ණය පැවතීමේ ඉහළ අවධානමක් පැවතිය හැකි බව නිරීක්ෂණය විය.

(ආ) පසුගිය වර්ෂයේ සිදු වූ විදේශීය ණය ප්‍රතිලබ්ධි වීම් සමාලෝචිත වර්ෂයේ දී සිදු වූ බවට ණය කළමනාකරණ පද්ධතියේ සටහන් කිරීම හේතුවෙන් රජයේ මූල්‍ය ප්‍රකාශනවල ප්‍රතිලබ්ධි වීම් අතර පහත වෙනස්කම් නිරීක්ෂණය විය.

ණය අංකය	රජයේ මූල්‍ය ප්‍රකාශන අනුව	තොරතුරු පද්ධතිය අනුව ප්‍රතිලබ්ධිවීම්	වෙනස
2012024	USD 947,057	USD 709,147	USD 237,910
2019019	USD 28,717,515	USD 24,938,700	USD 3,778,815
2019043	SAR 47,320,932	SAR 47,284,890	SAR 36,042
2015021	EUR 28,227	නැත	EUR 28,227
2012025	SAR 570,876	SAR 272,171	SAR 298,705

(ඇ) භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව විසින් විගණනයට ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව තැන්පත් ගිණුමේ පැවති රු.මිලියන 14.6 ක් වූ විදේශ ප්‍රදාන අදාළ අරමුණට නොයොදවා සමාලෝචිත වර්ෂය තුලදී රාජ්‍ය අදායමට බැරකර තිබුණි.

(ඈ) 2024 ජනවාරි 01 දින වන විටත් ශ්‍රී ලංකා රජය වෙත ප්‍රදාන ලෙස ලැබී තිබූ නමුත් 2024 දෙසැම්බර් 31 දින වන විටත් අදාල අරමුණට නොයොදවා අක්‍රියව පැවති විදේශ ප්‍රදාන වටිනාකම රු. මිලියන 36.8 ක් විය.

(ඉ) සමාලෝචිත වර්ෂයට පෙර ප්‍රදායකයන් 07 දෙනෙකුගෙන් ව්‍යාපෘති 13 කට අදාළව ලැබී තිබූ නමුත් අදාළ අරමුණට නොයොදවා සමාලෝචිත වර්ෂය තුළදී එකතුව රු. මිලියන 326.6 ක් අදාල ප්‍රදායකයින් වෙත ආපසු යවා තිබුණි.

(ඊ) 2019 ජනවාරි 01 දින සිට 2024 දෙසැම්බර් 31 දින දක්වා විදේශ ප්‍රදානයන් ලබා ගැනීම සඳහා මහා භාණ්ඩාගාරය විසින් එක් එක් විදේශ ප්‍රදානිත ව්‍යාපෘති 10 ක් සමඟ එකතු වටිනාකම ඇමරිකානු ඩොලර් මිලියන 22.72, රෙන්මින්බී මිලියන 2,000, යූරෝ මිලියන 43.13 හා කොරියන් වොන් බිලියන 14.3 ක් වූ විවිධ ව්‍යවහාර මුදලින් ගිවිසුම් වලට එළඹ තිබුණද ඊට අදාළව සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් විදේශ ප්‍රදාන ලද බවට විගණනයට තහවුරු නොවුණි.

(උ) 2024 ජනවාරි 01 දින වන විටත් දේශීය ප්‍රදාන ලෙස ලැබී තිබූ රු.මිලියන 146.5 ක් සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් අදාළ අරමුණට නොයොදවා ඇති බව නිරීක්ෂණය විය.

(උ) රජයේ මූල්‍ය ප්‍රකාශන අනුව, 2024 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව පැවති උපණය ශේෂය රු.මිලියන 195,004 ක් වී තිබුණි. විගණනයට ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව, අදාළ ආයතන උපණය ගිවිසුම් ප්‍රකාරව ගෙවීම් සිදු නොකිරීම හේතුවෙන් ආයතන 03 කට අදාළව වසර 05 ඉක්ම වූ රු.මිලියන 1,304 ක හිඟ උපණය වාරික ශේෂයක් අයකර ගත යුතුව පැවතුණි.

(එ) 2024 දෙසැම්බර් 31 දිනට උපණය වෙනුවෙන් ලැබිය යුතු පොළී වටිනාකම එකතුව රු.මිලියන10,733 ක් වූ අතර, ගිවිසුම ප්‍රකාරව ආයතන 3 ක ට අදාළව වසර 5 ඉක්ම වූ නොගෙවූ පොළිය එකතුව රු.මිලියන 912 ක් වී තිබුණි.

(ඒ) 2024 ජනවාරි 01 දිනට ආයතන 04 කට අදාළ උපණය ගිවිසුම් 07 ක් යටතේ පැවති උප ණය ශේෂ එකතුව රු.1,282 කින් සමාලෝචිත වර්ෂය තුළදී කිසිදු හිඟ මුදලක් අයකර ගැනීමට නොහැකි වී තිබුණි.

(ඔ) උප ණය ලබා දුන් ආයතනවලින් ලද ණය ශේෂ සනාථ කිරීමේ ලිපි සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂය ආරම්භයේදී හා අවසානයේදී රජයේ මූල්‍ය ප්‍රකාශනවල උපණය ශේෂය පිළිවෙලින් රු. මිලියන 861.5 ක හා රු. මිලියන 1,127.8 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ඕ) 2024 වර්ෂය තුළ හා ඊට පෙර කල් ඉකුත් වීම මත රු.මිලියන 143,094 ක සහ එකතුව ඇ.ඩො. 2,678.29 ක වටිනාකමින් යුතු භාණ්ඩාගාර ඇපකර 25 කට හා රු. මිලියන 32,550 ක හා ඇ.ඩො. 210 ක වටිනාකමින් යුතු සහන ලිපි 15 කට අදාළ වලංගු කාලය 2024 දෙසැම්බර් 31 දින වන විට නැවත දීර්ඝ කර තිබුණි.

(ක) සමාලෝචිත වර්ෂයේ රජයේ මූල්‍ය ප්‍රකාශන අනුව, බාහිර ආයතන වෙත අවස්ථා 11 ක දී නිකුත් කළ රු.මිලියන 102,474.21 ක්, ඇ.ඩො. මිලියන 2,824.31 ක් සහ යුරෝ 12.29 ක් වටිනා භාණ්ඩාගාර ඇපකර සහ අවස්ථා 17 ක දී නිකුත් කළ එකතුව රු.මිලියන 33,430 ක් සහ ඇ.ඩො. 210 ක් වටිනා සහන ලිපි 2024 දෙසැම්බර් 31 දින වන විට කල් ඉකුත් වී ඇති බවට නිරීක්ෂණය වූ අතර, අදාළ වලංගු කාලය ඉක්මවීමට පෙර විධිමත් පරිදි අවසන් කිරීමට හෝ වලංගු කාලය දීර්ඝ කිරීමට හෝ කටයුතු කර නොතිබුණි.

(ග) 2024 හෝ ඊට පෙර වර්ෂවල ලබා දුන් භාණ්ඩාගාර ඇපකර සහ සහන ලිපි වෙනුවෙන් දෙපාර්තමේන්තුව අවස්ථා 7 කට අදාළව ණය වාරික වශයෙන් රු.මිලියන 92 ක් හා ණය පොළිය ලෙස රු.මිලියන1,741 ක් වශයෙන් මුළු එකතුව රු.මිලියන 1,832 ක් අදාළ ආයතනයන්ට 2020 වර්ෂය තුළදී ගෙවා තිබුණි.

(ව) ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලීය රෝහල ඉදිකිරීම සහ වෛද්‍ය උපකරණ මිලදී ගැනීම සඳහා එම විශ්ව විද්‍යාලය විසින් ජාතික ඉතිරිකිරීමේ බැංකුවෙන් ලබාගත් ණය මුදලින් 2024 මාර්තු මාසයට අදාළව හිඟව පැවති ණය වාරිකය හා පොළිය පියවීම සඳහා රු. මිලියන 2,200 ක්ද, සීමාසහිත ශ්‍රී ලන්කන් ගුවන් සමාගම විසින් ලංකා බැංකුව සහ මහජන බැංකුව වෙත ගෙවිය යුතුව පැවති හිඟ ණය සහ පොළිය ගෙවීම සඳහා ඇ.ඩො. මිලියන 8 කට සමාන රු. මිලියන 2,400 ක් ද ගෙවා තිබුණි. ඒ අනුව, සමාලෝචිත වර්ෂයේ දී භාණ්ඩාගාර ඇපකර හා සහන ලිපි නිකුත් කිරීම හේතුවෙන් එකතුව රු.මිලියන 4,600 ක මුදලක් හිඟ ණය හා පොළී ශේෂයන් පියවීම සඳහා මහා භාණ්ඩාගාරයට දැරීමට සිදුව තිබුණි.

4.2 දේශීය ණය ප්‍රතිව්‍යුහගත කිරීම

(අ) 2024 ජනවාරි 01 දිනට ඇමරිකානු ඩොලර් මිලියන 240 ක් හෙවත් රු.මිලියන 77,742 ක් වූ ලංකා බැංකුවෙන් ලබා ගෙන තිබූ විදේශ ව්‍යාවහාර මුදල් බැංකු ඒකක (ව්‍යාපෘති නොවන) ණය මුදල හිඟ හිටි පොළිය රු.මිලියන 6,601 ක් ද සහිතව ශ්‍රී ලංකා රුපියල් වලින් යුක්ත භාණ්ඩාගාර බැඳුම්කර වලට පරිවර්තනය කර තිබුණි. ඒ අනුව 2024 දෙසැම්බර් 31 දිනට එම ණය ප්‍රතිව්‍යුහගතකරණයෙන් පසු ලංකා බැංකුවට ගෙවිය යුතු භාණ්ඩාගාර බැඳුම්කර වටිනාකම රු.මිලියන 82,551 ක් වී තිබුණි.

(ආ) බනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් භාණ්ඩාගාර ඇපකර මත රාජ්‍ය වාණිජ බැංකු දෙකකින් ලබා ගෙන, පසුව 2022 වර්ෂයේ දී මහා භාණ්ඩාගාරයට පවරාගත් ණය මුදලට අදාළව, 2024 ජනවාරි 01 දිනට පැවති ඇමරිකානු ඩොලර් මිලියන 2,435 හෙවත් රු.මිලියන 788,682 ක ශේෂය පහත පරිදි ප්‍රතිව්‍යුහගතකරණය කර තිබුණි.

- ලංකා බැංකුවට ගෙවිය යුතු ණය වටිනාකම වූ රු.මිලියන 410,430 ක් සහ එයට අදාළ හිඟ හිටි පොළිය රු.මිලියන 73,603 ක් ද ඇතුළුව ඇමරිකානු ඩොලර් වලින් යුක්ත කාලීන ණය පහසුකමක් බවට පරිවර්තනය කර තිබුණි.

- මහජන බැංකුවට ගෙවිය යුතු ණය මුදලෙන් රු.මිලියන 136,698 ක් සහ එයට අදාළ හිඟ හිටි පොළිය රු.මිලියන 30,464 ක් ද ඇතුළුව ඇමෙරිකානු ඩොලර් වලින් යුක්ත කාලීන ණය පහසුකමක් බවට පරිවර්තනය කර, ඉතිරිය රු.මිලියන 224,358 ක් සහ එයට අදාළ හිඟ හිටි පොළිය වන රු.මිලියන 38,225 ක් ද ඇතුළුව ශ්‍රී ලංකා රුපියල් වලින් යුක්ත භාණ්ඩාගාර බැඳුම්කර බවට පරිවර්තනය කර තිබුණි.

- එම ණය ප්‍රතිව්‍යුහගතකරණයෙන් පසු 2024 දෙසැම්බර් 31 දිනට ලංකා බැංකුවට ගෙවිය යුතු කාලීන ණය වටිනාකම ඇමරිකානු ඩොලර් මිලියන 1,582 ක් හෙවත් රු. මිලියන 462,783 ද මහජන බැංකුවට ගෙවිය යුතු කාලීන ණය වටිනාකම ඇමරිකානු ඩොලර් මිලියන 546 ක්

හෙවත් රු. මිලියන 159,823 ක් ද මහජන බැංකුවට ගෙවිය යුතු භාණ්ඩාගාර බැඳුම්කර වටිනාකම රු.මිලියන 262,583 ක් ද වී තිබුණි.

(ඇ) ඉහත ප්‍රතිව්‍යුහගත කරන ලද දේශීය ණය සම්බන්ධයෙන් ආපසු ගෙවීම් කළ යුතු කාලය හා එකඟ වූ පොළී අනුපාතය විගණනයට ඉදිරිපත් නොවීය.

5. මානව සම්පත් කළමනාකරණය

2024 දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ මට්ටමේ අතිරේක අධ්‍යක්ෂ ජනරාල්, අධ්‍යක්ෂ, නියෝජ්‍ය අධ්‍යක්ෂ/සහකාර අධ්‍යක්ෂ තනතුරු 07 ක්ද, ද්විතියික මට්ටමේ කළමනාකරණ සේවා නිලධාරී සේවයේ තනතුරු 14 ක් හා ප්‍රාථමික මට්ටමේ තනතුරු 08 ක් පුරප්පාඩුව පැවතුණි. තවද, ද්විතික මට්ටමේ සංවර්ධන නිලධාරි සේවයේ එක් තනතුරක් අතිරික්තව පැවතුණි. කාර්ය මණ්ඩල සමාලෝචනයක් සිදු කර පවතින පුරප්පාඩු පිරවීමට හෝ අනවශ්‍ය තනතුරු යටපත් කිරීමට හෝ සමාලෝචිත වර්ෂය තුළ දෙපාර්තමේන්තුව කටයුතු කර නොතිබුණි.

ඩී.ජී.ඒ.එස්. අනුලසිරි
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට